Cambridge Assessment International Education

# Cambridge O Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2024**

INSERT **1 hour 30 minutes**

**INFORMATION**
- This insert contains the reading passage.
- You may annotate this insert and use the blank spaces for planning. **Do not write your answers** on the insert.

This document has **2** pages.

KI/NL 333314/3
© UCLES 2024



https://xtremepape.rs/

Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–15** on the Question Paper.

ශ්‍රී ලංකාව අලි ගහනය සහිත රටකි. ලොව අලිඇතුන් ජීවත් වන්නේ රටවල් සුළු ප්‍රමාණයක පමණකි. මෙම සතුන්ගේ වාසය සඳහා අවශ්‍ය දේශගුණික තත්වයන් ලොව සෑම රටකම නොමැත. ශ්‍රී ලංකාව අලින්ට ජීවත්වීමට අවශ්‍ය දේශගුණික තත්වයන් සහිත රටවල් කිහිපයෙන් එකකි.

කෙසේ වූවත් ශ්‍රී ලංකාවේ නොයෙකුත් හේතූන් මත අලින් අනතුරු සහ ආබාධයන්ට ලක්වීම දක්නට ලැබේ. මෙසේ අසරණ වූ අලින් සඳහා වෙන්වුණු අනාථාගාරයක් ශ්‍රී ලංකාවේ, රඹුක්කන පින්නවල ප්‍රදේශයේ පිහිටා ඇත. මෙය ආරම්භ කර තිබෙන්නේ වසර එක්දහස් නවසිය හැත්තෑ පහේදීය. ශ්‍රී ලංකාව පුරා සිටින අලිඇතුන් අතරින් තනිව ජීවත්විය නොහැකි සහ ආබාධයන්ට ලක්වූ අලින් රැකබලාගැනීමේ පරමාර්ථයෙන් ආරම්භ කල මේ ස්ථානය, මහඔය නම් ගඟ අසල පිහිටි අක්කර විසිපහක සුන්දර බිමක පිහිටා ඇත. මේ වනවිට අලිඇතුන් සියයකට ආසන්න ප්‍රමාණයක් මෙහි සිටියි. වර්තමානයේ මෙම ස්ථානය මහජන ප්‍රදර්ශනය සඳහා වෙන්වුණු ස්ථානයක් බවට පත්ව ඇත.

පින්නවල අලි අනාථාගාරය අනිවාර්ය සංචාරක නැවතුම්පලකි. ශ්‍රී ලංකාවට පැමිණෙන බොහෝ සංචාරකයින් අලිඇතුන් නැරඹීමට ප්‍රිය කිරීම එයට හේතුවයි. මේ ස්ථානය අවට වෙළඳසල් ආපනශාලා ආදියෙන් සමන්විත පරිසරයක් නිර්මාණය වී ඇත්තේ එය සංචාරකයන් ගේ නැවතුම් පලක් වී ඇති නිසාය. පින්නවල අලි අනාථාගාරය යනු ශ්‍රී ලංකා රජය මගින් පාලනය වන රාජ්‍ය ආයතනයකි.

පින්නවලදී අලිඇතුන් ඉතා ළඟින් දැකබලා ගැනීමේ පහසුව මෙන්ම උන්ගේ හැසිරීම් නිරීක්ෂණය කිරීමට දේශීය මෙන්ම විදේශීය සංචාරකයින්ට හැකියාව ලැබේ. දවසට දෙවරක් අලින් ගඟ වෙත දිය නෑම සඳහා ගෙනයනු ලබන අතර මෙය ඉතා දැකුම්කලු දර්ශනයකි. විදේශීය සංචාරකයන්ට අමතරව දිනපතා ශ්‍රී ලාංකිකයන්ද මෙම ස්ථානය නැරඹීමට පවුල් පිටින් මෙහි පැමිණේ. මේ අතර සංචාර සඳහා එන පාසල් සිසුන්ද දක්නට ලැබේ. කුමන තරාතිරමක සංචාරකයෙකුට වුවත් පින්නවල අලි අනාථාගාරය ඉතා සුන්දර මෙන්ම අමතක නොවන ස්ථානයකි.

ශ්‍රී ලංකාවේ කැලෑතුල වන අලිඇතුන් ජීවත් වුණද මේ වනවිට එය විශාල අර්බුදයක් බවට පත් වී ඇත්තේ මිනිස් ජනාවාස හේතුවෙන් අලි මිනිස් ගැටුමක් ඇති වී තිබෙන නිසාය. මේ තුලින් අලින් සහ මිනිසුන් දිනපතාම මියයමින් සහ අනතුරට පත්වෙමින් තිබේ. මේ හේතුව නිසා අලින් සංඛ්‍යාව අඩුවෙමින් යයි. මිනිසුන් සහ අලින් අතර ඇති මේ ගැටුම පාලනය කිරීම සඳහා විවිධ උපක්‍රම ක්‍රියාත්මක වෙමින් පවතී. අලි වැටවල් ඉදි කිරීම, අලින් වනාන්තර තුලට එලවා දැමීම මෙන්ම වනාන්තර ප්‍රදේශ එළි කිරීම පාලනය මෙවන් ක්‍රම කිහිපයකි. එහෙත් මේ ගැටළුව අවසන් වන ආකාරයක් පෙනෙන්නට නොමැත. දිනපතාම අලින් මෙන්ම මිනිසුන්ද අනතුරට පත් වන බව පෙනේ. මේ ගැටලුව තුල පින්නවල අලි අනාථාගාරය මගින් සිදුවන සේවය වැදගත් වන්නේ අනාගතයේ ශ්‍රී ලංකාවේ අලින් මේ අනාථාගාරයේ පමණක් ඉතිරි වීමට ද ඉඩ ඇති බැවිනි. මේ නිසා වඳ වීමට ලක් වූ සතුන් ප්‍රභේදයක් ලෙසට අනාගතයේ අලින් නම් නොකිරීමට පින්නවල අලි අනාථාගාරයෙන් සිදුවන සේවය ඉමහත්ය.

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge Assessment International Education Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cambridgeinternational.org after the live examination series.

Cambridge Assessment International Education is part of Cambridge Assessment. Cambridge Assessment is the brand name of the University of Cambridge Local Examinations Syndicate (UCLES), which is a department of the University of Cambridge.



https://xtremepape.rs/